# හද රිදවන මතක සුවඳ



22

"කොහොම උනත් මුණේ කරන දෙයක් පරිස්සමින් කරපන්. උඹට මතකනේ අපේ ක්ලාස් එකේ හිටපු අර ගොඩගම වික්‍රමපාල උන දේ ?"

සාන්ත තෝමසයේ 10 ඩී පන්තියේ සිටි දඟකාර, දඩබ්බර, විනෝදකාමී සිසුන් අතර වික්‍රම කැපී පෙනුණේ අහිංසකයෙකු වශයෙනි. ඔහු හැමවිටම නිශ්ශබ්ද සිසුවෙකු විය. 1971 අප්‍රේල් කැරැල්ලෙන් පසුව විද්‍යාලය පටන්ගත් පළමු දිනයේම පැවැත්වූ 'එසැම්බ්ලියේ දී (රැස්වීමේදී) විදුහල්පතිතුමා ශෝකය පළකිරීමේ මිනිත්තු පහක නිශ්ශබ්දතාවයක් ප්‍රකාශයට පත් කළේ අප්‍රේල් කැරැල්ල හේතුවෙන් අප විදුහලෙන්ද සිසුවන් කිහිප දෙනෙකු මිය ගොස් හෝ ආගිය අතක් නැති බව තොරතුරු ලැබී ඇති බව පවසමිනි. වික්‍රම ද ඉන් එක් අයෙකු විය. වික්‍රම මාවරල පොලිසියට පහරදීමට යාමේදී පොලිස් වෙඩිපහරකින් මියගිය බවත්, පසුව දෙකට පලන ලද ඔහුගේ සිරුර පොලිසිය ඉදිරිපිට ගසක එල්ලා තිබූ බවත් පාසල පුරා ප්‍රචාරය වූ කථාවක් විය.

1981 දී අප්‍රේල් විරු සමරු උත්සවය මාතර උයන්වත්ත ක්‍රීඩාගංණයේදී සතියක් පුරා පැවැත්වූයේ මහත් උත්කර්ෂවත් අන්දමිනි. කළුතර දිස්ත්‍රික් ලේකම්වරයා මුණගැසී මාතර උත්සවයට අවශ්‍ය බඩු , භාණ්ඩ රැසක් ගෙන ඒමේ වගකීම පැවරුනේ මාහට ය. මම තවත් සොයුරන් දෙදෙනෙකු සමඟ කළුතර ගියෙමි. මට මගේ දෑස් අදහාගත නොහැකි විය. කළුතර දිස්ත්‍රික් ලේකම් ලෙස හෙවත් නායකයා ලෙස මා පිළිගත්තේ මගේ පාසල් මිතුරා වූ වික්‍රම ය.

වැලිගම සංවිධායකගේ නම මම අහලා තිබුණා. ඒත් මුණේ කියල මං කොහොමටත් හිතුවේ නෑ' වික්‍රම (නිමල්) සිනාසෙමින් පැවසී ය. පාසල් වියේදී දුටු ඔහුගේ අහිංසක සිනහව වසර 10 කට පසුවත් නොවෙනස්ව තිබිණ.

1971 දී මෙන් 1989 දී ද නැවතත් මට ආරංචි වුයේ මාගේ පාසල් මිතුරා වූ 'වික්‍රම' (ගොඩගම නිමල්) ප්‍රේමදාස රජයේ ඝාතන කල්ලිවලට හසු වී මැරුම් කෑ බවය. 1981 දී ඔහු හමු වූ ලෙසින් කොතැනකදී හෝ නැවත ඔහු හමුවේවායි මම ප්‍රාර්ථනය කරමි.

> **ජුලි මාසයේ දිනක මා හමුවෙන්නට ආවේ පක්ෂයේ පැරණි සාමාජිකයෙකුගේ පරපුරේ දෙවන පරම්පරාවේ කෙනෙකි. තමා සමඟ ආ ගිය තොරතුරු කථා කරමින් සිටින අතරතුරේදී  ඔහු මෙසේ පැවසී ය. "සහෝදරයා පත්තරවල දකින්න ඇතිනේ අර මන්ත්‍රීට දීපු වැඩේ. වාහනේ හිටිය අනෙක් උන් ඔක්කෝම බේරලා හරියටම දුන්නේ මිනිහගේ ඔළුවට. දැන් නිකම් මගේ ඒම් එක කෙස් ගහට වැඩ කරනවා"**

මා ඉහත කී අයුරින් ජනතාවගෙන් ලබාගන්නා ආධාර ලෙස අමාරුවෙන් එකතු කර ගන්නා මුදල්ද, ජාත්‍යන්තර සබඳතා තිබූ රටවල් වලින් හා පක්ෂ වලින් ලැබෙන පරිත්‍යාග මුදල්ද තැන්පත් කර තැබීමට පක්ෂයට බැංකු ගිණුමක් තිබුණේ නැත. එම මුදල් තැන්පත් කර තබන ලද්දේ බැංකු කෙරෙහි තබන්නාවූ විශ්වාසයටත් වඩා ඉහළ විශ්වාසයක් තිබූ සහෝදරවරුන්ගේ හා හිතවතුන්ගේ භාරයේ ය.

ඉරාකයෙන් ලැබුණ මුදල එකල පක්ෂයට ලැබුණ විශාල පරිත්‍යාගයක් ලෙස සැලකිය හැකිය. සදාම් හුසේන් ගේ බාත් සමාජවාදී පක්ෂය සමඟ ජ.වි.පෙ. සබඳතා ගොඩනැගෙමින් පැවතුණි. සදාම් හුසේන් ජනාධිපතිවරයාගෙන් ලද විශාල පරිත්‍යාගයෙන් පක්ෂයට මිලදී ගත් දේ අතර විමුක්ති ගී කණ්ඩායමට රටවටා යාම සඳහා බස් රථයක් හා පක්ෂයේ පුවත්පත් අච්චු ගැසීම සඳහා නවීනතම මුද්‍රණ යන්ත්‍ර ද විය.

සදාම් හුසේන්ගෙන් ලද මේ ආධාරයට ප්‍රති උපකාර කිරීමක් වශයෙන් කොළඹ වරායේ නවතා තබන ලද ඉරාන නෞකාවකට ජ.වි.පෙ. විසින් ගිනි තබන ලද බව එකල පුවත්පත්වල පළ වූ පුවතක් විය.

ජ.වි.පෙ. න් නෙරපා හරින ලද ඇතමුන් පක්ෂයේ මුදල් වංචා කළ අවස්ථා ඇතත්, ජ.වි.පෙ. විරුද්ධවාදීන් අතර පවා ඇති පොදු මතය නම් ජ.වි.පෙ. සාමාජිකයන් පක්ෂයේ මුදල් සතයක් හෝ වංචා නොකරන පිරිසක් බවය. එය සත්‍යයකි. එහෙත් පරිස්සමට තැබූ දේ ඇලියාවට ගියාක් මෙන් වූ සිදුවීම්ද පක්ෂයේ නොතිබුණා නොවේ.

පක්ෂයේ පොදු අරමුදල් වූ රුපියල් ලක්ෂ කිහිපයක මුදල් පරිස්සමට තබා තිබුණේ එක්තරා දිස්ත්‍රික්කයක නායකකයෙක් භාරයේ ය. රෝහණ විජේවීර සහෝදරයා මෙම දිස්ත්‍රික්කයට පැමිණි කල ඔහුගේ ආරක්ෂකයා හෙවත් 'බොඩිගාඩ්' වශයෙන් කටයුතු කරන සහෝදරයෙක් සිටියේය. එම දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයේ පක්ෂයේ සංවිධාන කටයුතු වලට මේ සහෝදරයාගේ හයිය නිසා ලැබුණේ හයියකි.

මෙම බොඩිගාඩ් සහෝදරයා-ගේ සහෝදරයාට පුද්ගලික බස් රථයක් ගැනීමට අවශ්‍ය වූ අවස්ථාවේදී මුදල් අඩුපාඩුවක් සිදුවුයෙන් දිස්ත්‍රික් නායකයා භාරයේ තිබූ පක්ෂයේ අරමුදල්වලින් කොටසක් ණය මුදලක් ලෙස දීමට තීරණය වුයේ පක්ෂයේ හිතවත් සහෝදරයෙකු-ගේ දියුණුවට නිකම් තියන මුදලින් උපකාරයක් කිරීමේ පදනමිනි. පක්ෂයට අවශ්‍ය වන ඕනෑම මොහොතක එම මුදල් නැවත ලබාදීමේ එකඟතාවක්ද විය.

මෙම බස් රථයෙන් පක්ෂයේ වැඩ කටයුතුවලටද ප්‍රයෝජනයක් අත්විය. කොළඹ හා නුවර පැවති පක්ෂයේ සම්මේලනවලට, මැයි රැලියට යාමට බස්රථය යොදා ගැනුණි. බස්රථයේ හිමිකරු පක්ෂ හිතවතා බසයේ ආදායමින් පක්ෂයේ මුදල් කොටස් වශයෙන් ගෙවමින් සිටියද පක්ෂයට මුදල් අවශ්‍ය වූ විට අදාළ මුදල එක්වර ලබාදීමට හෙතෙමේ අපොහොසත් විය. පක්ෂය හා ඔහු අතර තිබූ හොඳහිත පලුදු විය. බොඩිගාඩ් සහෝදරයා පවා පක්ෂයෙන් දුරස්වන තැනට කරුණු යෙදිණි.

පක්ෂයේ සොයුරු-සොයුරියන් අනේකවිධ වෙහෙස විඳිමින් කැටවලට ආධාර තර කරන ලද පක්ෂ අරමුදලේ කොටසක් වූ මෙම මුදල සහමුලින්ම නැවත පක්ෂයට ලැබුණේදැයි මට ඉඳුරාම පැවසිය නොහැක.

1989 මැද භාගය වනවිට දේශප්‍රේමී රජයක් පිහිටුවීම සඳහා දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය මෙහෙයවන සන්නද්ධ අරගලය උච්චතම අවස්ථාවකට අවතීර්ණව තිබුණි. උදාවන සෑම දිනකම මහපොළොව මත වැටෙන පළමු අරුණැල්ලේද සැඟවී තිබුණේ මරණයේ ගුප්ත බියකරු බවය. යමෙකු නිවසේ දොරපියන් හැරදා ආශ්වාස කරන පළමු සුළං රොදේ රැඳී තිබුණේ ලේ සුවඳය.

ජුලි මාසයේ දිනක මා හමුවෙන්නට ආවේ පක්ෂයේ පැරණි සාමාජිකයෙකුගේ පරපුරේ දෙවන පරම්පරාවේ කෙනෙකි. තමා සමඟ ආ ගිය තොරතුරු කථා කරමින් සිටින අතරතුරේදී  ඔහු මෙසේ පැවසී ය. "සහෝදරයා පත්තරවල දකින්න ඇතිනේ අර මන්ත්‍රීට දීපු වැඩේ. වාහනේ හිටිය අනෙක් උන් ඔක්කෝම බේරලා හරියටම දුන්නේ මිනිහගේ ඔළුවට. දැන් නිකම් මගේ ඒම් එක කෙස් ගහට වැඩ කරනවා"

ඔහු සිනාසුනේ කැටපෝලයකින් විද කුරුල්ලෙකු බිමදාගත් දඟකාර ළමයෙකුගේ සැහැල්ලුවෙනි. ඔහු කයිවාරුකාරයෙකු නොවන වග මට සහතිකය. ඔහු හැදුණ වැඩුණ පරිසරය ඔහු දක්ෂ වෙඩික්කාරයෙකු කළ බව මම දන්නෙමි. දඩයමේ ගොස් සතුන් මරණ දඩයක්කාරයන්ගේ මුහුණේද, මිනිස් ඝාතනය කර ඇති මිනීමරුවන්-ගේ මුහුණේද යම් කුරිරු ස්වභාවයක්, දරදඬු ගොරෝසු පෙනුමක් ඇතිසැටි මම දැක ඇත්තෙමි.

*ලබන කලාපයට*

රෝහිත මුණසිංහ
ප්‍රංශයේ සිට

